බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පුරප්පාඩු

(කොන්ත්‍රාත් පදනම මත)

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා මෙහි සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර	**සාමාන්‍යාධිකාරී (HM 2-1)**
සුදුසුකම්	**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් සමග පශ්චාත් උපාධියක් සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව සම්පූර්ණ කළ පළපුරුද්ද.**
වැටුප	**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 HM 2-1** **රු. 140,317/= (මාසිකව)** **චක්‍රලේඛ අනුව කොන්ත්‍රාත් තනතුරට අදාළ අනෙකුත් දීමනා**
වයස් සීමාව	**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 55ට නොවැඩි විය යුතුය.**

තනතුරේ ස්වභාවය හා සේවා කොන්දේසි

මෙම බඳවාගැනීම් මූලික වශයෙන් වසර 01 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වේ. එමෙන්ම ලිත් මසක දැනුම් දීමකින් කොන්ත්‍රාත් කාල සීමාව අවසන් කිරීමට පත්වීම් බලධාරියාට හැකියාවක් ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා දායක විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

අයදුම්කරුවන් සඳහා කොන්දේසි

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් තනතුරේ රාජකාරී හොඳින් ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය. **(කෙසේ වෙතත් ඔබගේ නිත්‍ය සේවා ස්ථානය නො.303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 වේ.)**
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත්‍රය සමඟ උප්පැන්න සහතිකයේ / අධ්‍යාපන / වෘත්තීය සහතික සහ සේවා සහතිකවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.
- මෙය කොන්ත්‍රාත් තනතුරකි. තෝරාගත් අපේක්ෂකයින් තම වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, ආයතනය සේවක අර්ථ සාධක අරමුදල සඳහා 12% ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ක් දායක කරනු ඇත.
- මූලික වැටුප සහ කොන්ත්‍රාත් තනතුර සඳහා හිමි අනෙකුත් අනුමත දීමනා ආයතනය විසින් ගෙවනු ලැබේ.

රජයේ / රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන්නෙකු නම් අයදුම්පත්‍රය අදාළ ආයතන ප්‍රධානීගේ නිර්දේශ සහිතව එවිය යුතුය. නියමිත සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද, අසම්පූර්ණ සහ නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත පුරප්පාඩු පිරවීමේ අවසන් තීරණය ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය	මෙම දැන්වීම පළ කළ දින සිට දින 14ක් ඇතුළත (රජයේ වැඩ කරන දිනවලදී).
අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය	ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් **සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්** යොමු කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
2026 නොවැම්බර් 16 දින.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED